# දැන්වීම

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය වන සේවකයන් 09 දෙනෙකු **2026.04.20** දින සිට **2026.12.31** දින දක්වා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත පුද්ගලයන් ලියාපදිංචි කර සේවය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

එබැවින් අදාළ කොන්දේසි වලට යටත්ව හා සුදුසුකම් සපුරා ඇති මෙම සේවය ලබාදීමට අපේක්ෂා කරනු ලබන පුද්ගලයන් වේනම්, අදාළ අයදුම්පත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ලබාගෙන ඒවා නිවැරදිව සම්පූර්ණ කර **2026.04.02** දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙසට මෙමගින් දන්වා සිටිමි. (අදාළ සුදුසුකම් සියල්ල 2026.04.02 දින වන විට සපුරා තිබිය යුතුය)

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | කායික හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු - (01) | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. | - | වයස අවුරුදු 18ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය. කාර්යයට සුදුසු මනා ශරීර සෞඛ්‍යයක් පැවතීම. |
| ආදාහනාගාර සහායක - (01) | අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. | - | වයස අවුරුදු 18ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය. කාර්යයට සුදුසු මනා ශරීර සෞඛ්‍යයක් පැවතීම. |

<table>
<tr>
<td>ආයුර්වේද ඖෂධ සංයෝජක - (02)</td>
<td rowspan="2">i.අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.<br><br>ii.අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br><br>iii.අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි.</td>
<td rowspan="2">-</td>
<td rowspan="2">වයස අවුරුදු 18ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය.<br>කාර්යයට සුදුසු මනා ශරීර සෞඛ්‍යයක් පැවතීම</td>
</tr>
<tr>
<td>පැස්සුම්කරු - (01)</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| පෙර පාසල් ගුරු - (04) | i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>සහ<br><br>ii.අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් (01) හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | පෙර පාසල් ගුරු තනතුරු සඳහා මාස 06කට නොඅඩු පෙර පාසල් ගුරු ඩිප්ලෝමාවක් ලබා තිබීම. | i.සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br><br>ii.වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය<br><br>iii.අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.<br><br>iv.අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 03ක් දකුණු පළාත තුල ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. |

❖ වැඩිදුර විමසීම් සඳහා කාර්යාලීය දුරකථන අංකය වන 0472237275 විමසන්න.

එච්.එල්.ජයසිරි
සභාපති
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව
2026.03.20